| | | | |
|---|---|---|---|
| 42 | LX | EX | 01 |

නව ඇපකරය ☐ | ආකෘතිය අමුණා ඇත ☐

දීර්ඝ කිරීම/ සංශෝධනය ☐ | ඇපකර යොමුව ☐

නැවත නිකුත් කිරීම ☐ | ඇපකර යොමුව ☐

දැනටමත් ෆැක්ස් මගින් යවා ඇත ☐

ගාස්තු හරකිරීමට නියමිත ගිණුම් අංකය :- ..........................................................................

ආන්තිකය හරකිරීමට නියමිත ගිණුම් අංකය :- ......................................................................

## ඇපකර ලිපියක් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රති හානිපූරණ ලිපිය

වෙත:- **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,**
(සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය: PQ 27)
අංක. 40, නවම් මාවත,
කොළඹ 02.

හිතවත් මහත්මයාණනි,

............................ දින සිට ............................ දිනය දක්වා එම දින දෙකද ඇතුලත්වන කාලසීමාව දක්වා වලංගුවන පරිදි

................................................ සැපයීම වෙනුවෙන් ............................ දින අවසන්වන ටෙන්ඩර්පත්‍ර අංක ...................... දරන ටෙන්ඩරපත්‍රය සම්බන්ධයෙන් වූ **ලංසු බැඳුම්කරය;**

........................ සැපයීම වෙනුවෙන් ටෙන්ඩර්පත්‍ර අංක ...................... දරන ටෙන්ඩර්පත්‍රය යටතේ වූ **ඉටුකිරීමේ බැඳුම්කරය;**

........................ සැපයීම වෙනුවෙන් ටෙන්ඩර්පත්‍ර අංක ...................... දරන ටෙන්ඩර්පත්‍රය යටතේ වූ **අත්තිකාරම් ගෙවීම් ඇපකරය;** සහ

........................ සම්බන්ධයෙන් වන ගෙවීම සඳහා වූ **ඇපකරය;** සඳහා ........................... වන

ශ්‍රී ලංකා රුපියල් ........................... වූ (ශ්‍රී.ල.රු. ..................) මුදලක් සඳහා ...................................... යන ලිපිනයේ පදිංචි ........................... වෙනුවෙන් සහ ......................... යන අය වෙනුවෙන්

(අර්ථලාභියාගේ නම සහ ලිපිනය) (මෙහි මින්මතු "ඇපකර ලිපිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මා/අප විසින් අනුමතකර අත්සන්කරන ලද ආකෘතියෙන් වූ ඇපකර ලිපියක් (සම්බන්ධකර ඇත්නම්) මාගේ/අපගේ ඉල්ලීම පරිදි (මෙහි මින්මතු "බැංකුව" යන යෙදුම හෝ ප්‍රකාශය අනුව **"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී"** ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස්වන සහ ඇතුලත් වන) **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී** ආයතනය විසින් නිකුත්කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, ........................................................... යන ලිපිනයේ පදිංචි ...................................................... වන මා/අප විසින් පහත පරිදි කියා සිටිනු ලැබේ; එනම්,

1. ඇපකර ලිපිය සම්බන්ධයෙන් හෝ ඒ තුලින් උපචිතවන හෝ ඔබ විසින් එම ඇපකර ලිපිය නිකුත්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උපචිතවන (ඇපකර ලිපිය සම්බන්ධයෙන් ඔබ විසින් දරනු ලැබිය හැකි සියලු නෛතික සහ වෙනත් පිරිවැය, ගාස්තු සහ විදයම් හෝ මෙම හාණිපූරණය යටතේ ඔබගේ අයිතිවාසිකම් බලාත්මක කිරීම හේතුවෙන් හෝ එසේ බලාත්මක කිරීමට උත්සාහ කිරීම හේතුවෙන් ඔබ විසින් දරනු ලැබිය හැකි සියලු නෛතික සහ වෙනත් පිරිවැය, ගාස්තු සහ වියදම් ඇතුලු) ඕනෑම ආකාරයක සියලු නඩුකටයුතු, ඉල්ලීම්, හිමිකම්පෑම්, වගකීම්, පාඩු, පිරිවැය සහ වියදම්වලට එරෙහිව මා වෙනුවෙන්/ අප වෙනුවෙන්* මාගේ/ අපගේ* පුද්ගලික නියෝජිතයන්, හිමිකම්ලාභී හෝ සම්බන්ධතා සහිත අනුප්‍රාප්තිකයන්, පැවරුම්ලාභීන් වෙනුවෙන් මා/ අප විසින් ඔබව හානිපූරණය නිදහස්ව තබන බවට මෙයින් එකඟව ප්‍රතිඥා දී සිටිනු ලැබේ.

2. මා විසින්/ අප විසින් එම මුදල් පළමුව ගෙවන ලද හෝ දරන ලද දිනයේ සිට ඒ සඳහා වූ ගෙවීම් සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් (තීන්දුකිරීමේ දිනයෙන් පසුව මෙන්ම එම දිනයට පෙර පැවති) ඒ මත වූ පොළියද සමග ඔබ විසින් එම මුදල් පළමුව ඉල්ලාසිටි අවස්ථාවේදීම ඔබ වෙත ගෙවන බවට සහ ප්‍රතිපූරණය කරන බවට මා/ අප විසින් එකඟව සිටිනු ලැබේ.

3. ඕනෑම ආකාරයකින් හෝ ඕනෑම ආකාරයක කාර්යයක් සඳහා බැංකුවේ සන්තකයට හෝ පාලනයට එන සියලු මුදල් සහ දේපළ මා/ අප විසින් මෙම හානිපූරණය සම්බන්ධයෙන් වූ ඇපකරයක් වශයෙන් බැංකුව වෙත හිලව් කිරීමේ සහ උචිත ලෙස යොදාගැනීමේ අයිතිය සහිතව හිලව් පිණිස තබන බවට මා/ අප විසින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

4. මාගෙන්/ අපගෙන් විමසීමෙන් හෝ තවදුරටත්වූ බලය ලබාගැනීමෙන් තොරව* සහ ඇපකර ලිපිය සම්බන්ධයෙන් හෝ ඇපකර ලිපිය යටතේ ඔබ වෙත ලැබෙන යම් ප්‍රකාශයක් හෝ සහතිකයක් සාධාරණීකරණය කිරීම පිළිබඳ විමර්ශනය කිරීමෙන් තොරව හෝ ඒවායේ වලංගුභාවය, අව්‍යාජභාවය හෝ නිවැරදිභාවය පිළිබඳ විමසීමෙන් තොරව සහ මාගේ/ අපගේ පාර්ශවයෙන් සිදුවිය හැකි ඒ පිළිබඳ හබකර සිටීමක් පිළිබඳ නොසලකා හරිමින් ඇපකර ලිපිය යටතේ ඉල්ලා සිටින හෝ සිදුකරන ලෙස පෙනීයන හෝ උද්දේශිත වන යම් ගෙවීම් සඳහා මාගේ/ අපගේ ගිණුමෙන් හෝ මාගේ/ අපගේ ගිණුම්වලින් බැරකම් කරන ලෙස සහ ගෙවීම් කරන ලෙස හෝ එම ඇපකර ලිපිය යටතේ හිමිකම්පාන ලෙස හෝ සිදුකරන ලෙස පෙනීයන හෝ උද්දේශිතවන යම් ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියාකරන ලෙස මා/ අප විසින් අහෝසිකල නොහැකි ලෙස ඔබවෙත බලය පවරා සිටිනු ලබන අතර එම හිමිකම්පෑම් සහ ඉල්ලීම් මගින් මම/ අපි බැඳී සිටින බවට මෙන්ම එම හිමිකම්පෑම් හෝ ඉල්ලීම් ඔබ විසින් ගෙවනු ලැබිය යුතු හෝ ඒවාට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු බවට වූ ඔබ සහ මා/ අප අතර පවතින තීරණාත්මක සාක්ෂියක් ලෙස පිළිගනු ලබන බවට මා/ අප විසින් එකඟව සිටිනු ලැබේ.

5. මෙම හානිපූරණය යටතේ වූ ඔබගේ අයිතිවාසිකම්, මාගෙන් හෝ අපගෙන් හෝ වෙනත්යම් තැනැත්තකුගෙන් ඔබ විසින් දැනට දරනු ලබන හෝ පසුව දරනු ලැබිය හැකි වෙනත්යම් එක් හෝ වැඩි හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ වෙනත්යම් බැඳීම්වලට අතිරේකව විය යුතු මෙන්ම එවැනි කිසිදු හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ බැඳීම්වලට එමගින් කිසිදු ආකාරයකින් අගතියක් හෝ බලපෑමක් සිදු නොවිය යුතු වේ. ඔබ විසින් ඕනෑම අවස්ථාවකදී මාගෙන් හෝ අපගෙන් විමසීමකින් තොරව ගෙවීම්කිරීම සඳහා යම් කාලයක් ලබාදීම හෝ වෙනත් යම් ඉඩදීමක් ප්‍රදානය කිරීම මෙන්ම ඕනෑම අවස්ථාවක දී ඔබ විසින් දරනු ලබන වෙනත් යම් හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ වෙනත් යම් බැඳීම් සම්පූර්ණ කිරීම හෝ බලාත්මක කිරීම අත්හැරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, වෙනස්කිරීම, හුවමාරු කිරීම හෝ එසේ සම්පූර්ණ කිරීමෙන් හෝ බලාත්මක කිරීමෙන් වැළකී සිටීම කරනු හැකිය; තව ද එහි යම් පාර්ශවයක් හෝ ඒවායින් ඕනෑම දෙයක් මුදාහැරීම හෝ නිශ්කාශනය කිරීම හෝ මෙම හානිපූරණය යටතේ වූ මාගේ/ අපගේ* වගකීමට බලපෑමක් සිදුවීමෙන් තොරව ඔබ විසින් යෝග්‍ය බවට සලකන ආකාරයට ඇපකර ලිපියේ සඳහන් අර්ථලාභියා හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමග එම හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ වෙනත් යම් බැඳීම් ඒකාබද්ධ කිරීම,

ඒකාබද්ධ කිරීම් ප්‍රතිග්‍රහනය කිරීම සහ වෙනත් යම් වැඩපිළිවෙල සකස් කිරීම කරනු ලැබිය හැකිය.

6. මෙම ඇපකර ලිපියේ මුල් නියම ප්‍රකාරව හෝ මාගේ/අපගේ ඉල්ලීම පරිදි සහ ඒ සඳහා ඔබ විසින් එකඟවන ආකාරයට සහ ඇපකර ලිපියේ අර්ථලාභියා විසින් ඒ සඳහා එකඟවන ආකාරයට මෙම ඇපකර ලිපිය කලින්කල වෙනස්කිරීම, සංශෝධනය කිරීම, අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම කරනු ලැබිය හැකිය. එසේ කලින්කල වෙනස් කරනු ලබන, සංශෝධනය කරනු ලබන, අලුත් කරනු ලබන හෝ දීර්ඝ කරනු ලබන ඇපකර ලිපිය සඳහා මෙම හානිපූරණය යටතේ වූ මාගේ/ අපගේ වගකීම අඛණ්ඩව අදාළ විය යුතු වේ.

7. මේ හානිපූරණය සම්බන්ධයෙන් වූ යම් අයිතිවාසිකමක්, බලතල, වරප්‍රසාදයක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී ඔබගේ පාර්ශවයෙන් සිදුවන කිසිදු ප්‍රමාදයක් හෝ මගහැරීමක් මගින් එම අයිතිවාසිකම, බලතල, වරප්‍රසාදය හෝ ප්‍රතිකර්මය දුබලකිරීමක් ලෙස හෝ එය අත්හැරීමක් ලෙස සලකනු නොලැබිය යුතු මෙන්ම එවැනි අයිතිවාසිකමක, බලතලවල, වරප්‍රසාදයක හෝ ප්‍රතිකර්මයක තනි හෝ අර්ධ ක්‍රියාත්මක කිරීමක් මගින් එම අයිතිවාසිකම, බලතල, වරප්‍රසාදය හෝ ප්‍රතිකර්මය තවදුරටත් ක්‍රියාත්මක කිරීම හෝ වෙනත් යම් අයිතිවාසිකමක්, බලතල, වරප්‍රසාද හෝ ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීමක් වළක්වාලනු නොලැබිය යුතු ය. මෙම හානිපූරණයෙහි විධිවිධාන සලස්වා ඇති අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ ප්‍රතිකර්ම සමුච්චිත ඒවා වන අතර නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති යම් අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද හෝ ප්‍රතිකර්මවලින් සුවිශේෂී වන ඒවා නොවේ.

8. මෙම හානිපූරණය එක් තැනැත්තකුට වඩා වැඩි තැනැත්තන් ගණනක් විසින් හෝ වෙනුවෙන් අත්සන්කර ඇත්නම් (මෙහි මින්මතු මුල් අත්සන්කරුවන් යනුවෙන් සඳහන් කරනු ලබන තැනැත්තන්), සහ ඔවුන්ගෙන් එක් අයකු හෝ වැඩිදෙනකු මෙම හානිපූරණයේ සඳහන් විධිවිධාන මගින් බැඳී නොසිටීනම්, (මෙම හානිපූරණය අනිසි ලෙස ලියාඅත්සන් කිරීම මත ඔහුට/ ඔවුන්ට හැකියාව නොමැතිවීමේ හේතුව නිසා හෝ වෙනත් ඕනෑම හේතුවක් නිසා), එම වෙනත් මුල් අත්සන්කරු/ අත්සන්කරුවන් කිසිදු අවස්ථාවක දී මෙම ලේඛනයේ පාර්ශවයක් නොවූ ලෙස සලකමින් ඉතිරි මුල් අත්සන්කරු/ අත්සන්කරුවන් මෙම හානිපූරණයේ විධිවිධාන මගින් අඛණ්ඩව බැඳී සිටිය යුතුවේ.

9. මෙම හානිපූරණය එක් තැනැත්තකුට වඩා වැඩි දෙනෙකු විසින් අත්සන් කරනු ලබන අවස්ථාවක දී, මෙම හානිපූරණයේ යම් පාර්ශවයක් නිදහස් කිරීම හෝ

මුදා හැරීම මගින් මෙහි වෙනත් යම් පාර්ශවයක් වෙත යම් ප්‍රතිවිපාක ඇති කිරීමෙන් තොරව හෝ එම වෙනත්යම් පාර්ශවයට එරෙහිව ඔබගේ අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සඳහා අන්‍යාකාරයකින් අගතියක් හෝ බලපෑමක් ඇති කිරීමෙන් තොරව ඉහත අත්සන්කරනු ලබන එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු ස්වකීය වගකීමෙන් නිදහස් කිරීම සඳහා හෝ ඒකාබද්ධ කිරීම සඳහා, ඒකාබද්ධ කිරීමක් පිළිගැනීම සඳහා හෝ එවැනි තැනැත්තන් සමග වෙනත් වැඩපිළිවෙලක් සකස්කිරීම සඳහා ඔබට නිදහසක් තිබිය යුත්තේය.

10. මේ යටතේ වූ මාගේ/ අපගේ වගකීම් සපුරාලනු ලබන තෙක් මෙම හානිපූරණය බලාත්මකව පවතියි.

11. තත්කාර්ය සඳහා මාගේ/ අපගේ පූර්ව අනුමතය ලබා ගැනීමෙන් තොරව මේ යටතේ වූ බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත්යම් පාර්ශවයක් වෙත පැවරීම සඳහා බැංකුවට අයිතියක් ඇති බවට මා/ අප විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

12. මෙම හානිපූරණය ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනයවන බවට මා/ අප විසින් එකඟව සිටිනු ලැබේ.

මෙයට විශ්වාසී.

---

වගකීමෙන් සීමිත සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ආදායම්බදු මුද්දරයක් මත සමාගමේ පොදු මුද්‍රාව තබා යථා පරිදි සහතික කරනු ලැබිය යුතුය.

* අනවශ්‍ය දෑ ඇත්නම් කපාහැර අත්සන් තබන්න.

---

බැංකුවේ ප්‍රයෝජනය සඳහා පමණි

| | | | |
|---|---|---|---|
| ඇතුලත් කිරීම් සම්මත කිරීම | | ගිවිසුම් යොමුව | |
| O/R නිවැරදි බවට | | භාවිතකරුගේ යොමුව | |

** අදාල දේ තෝරන්න

ශාඛාවේ ප්‍රයෝජනය සඳහා පමණි

CID:-

පොදු අනුපාතිකය:-

වෙනුවට සීමා කිරීම ☐ හෝ

100% මුදල් ආන්තිකය ☐